පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව **සබරගමුව** - සති පාසල

විෂය - චිත්‍ර කලාව

මාර්තු මාසය - 01 සතිය

සැකසුම - එල්.මහේෂ් විජේවර්ධන
ර/නිවි/කරවිට මධ්‍ය විද්‍යාලය

ශ්‍රේණිය - 9

නිපුණතාව - පරිසරය ආශ්‍රිත තේමා යටතේ චිත්‍ර සංරචනය කරයි

නිපුණතා මට්ටම - මානව හා සත්ත්ව රූප රේඛාවෙන් අධ්‍යනය කරයි

ක්‍රියාකාරකම - සත්ත්ව රූප රේඛාවෙන් අඳිමු

පැවරුම - පහත පියර අනුව ක්‍රියාකාරකම කරන්න

පියවර (1) - රූප වාහිනිය හෝ ස්මාර්ට් ජංගම දුරකතනය (Youtube) වැනි උපකරණයක් භාවිතයෙන් අප අවට පරිසරයේ වෙසෙන සතුන්ගේ හැසිරීම් හා ක්‍රියාකාරකම් වීඩියෝ පටයක් මඟින් නරඹන්න (ඔබ නිවසේ වෙසෙන සතුන්ගේ සජීවී හැසීම්ද නැරඹිය හැකිය)

පියවර (2) - සතුන්ගේ හැසිරීම් නැරඹීමේ දී ඔවුන්ගේ පවතින සුවිශේෂීතා, ක්‍රියාකාරකම්, හා ඉරියව් ආදිය හොඳින් නිරීක්ෂණය කරන්න

පියවර (3) - ඔබ නිරීක්ෂණයෙන් හඳුනාගත් සුවිශේෂි ඉරියවු යොදා ගනිමින් සත්වයින් පස් දෙනෙකුගේ දළ සටහන් අඳින්න

පියවර (4) - දළ සටහන් මඟින් නිර්මාණය කළ සත්ත්ව රූපවල එළිය අඳුර යොදා ත්‍රිමාණ බව දක්වමින් රේඛාවෙන් මතු කරන්න

පියවර (5) - ඉහත ඔබ නිර්මාණය කළ සතුන් පස් දෙනාගේ වෙනත් ඉරියව්ද යොදා රේඛා අධ්‍යනයේ යෙදෙන්න.